# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2070/56 - 2018 මැයි මස 12 වැනි සෙනසුරාදා - 2018.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2018 මැයි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,<br>ජනාධිපති.

2018 මැයි මස 12 වැනි දින,<br>කොළඹ 01,<br>ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක (3) ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරිමෙන් ;

(2) එම නිවේදනයෙහි "අංක (4) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදිඃ-

(අ) එම ශීර්ෂය "අංක (3) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය" වශයෙන්

(ආ) එහි II වැනි තීරුවෙහි 5 වැනි අයිතමය ඉවත් කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අයිතම 6 සහ 7 නැවත අංක ගත කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "8. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් (සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම හැර)" යන්න

7. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් (ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් හැර) වශයෙන්


1A - G 27319 — 432 (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "7. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් (ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් හැර)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

8. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමය ඉවත් කිරීමෙන්;

- ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය පනත (1990 අංක 18)

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ක්ෂුද්‍ර මූල්‍ය පනත (2016 අංක 6)" ට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්;

- ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත (2002 අංක 35)

(3) එම නිවේදනයෙහි අංක (5 ) සිට (7) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක ගත කිරීමෙන්;

(4) එම නිවේදනයෙහි "අංක (8) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (7) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 16 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

17. දෙපාර්තමේන්තුවල කළමනාකරණ විගණන ප්‍රවර්ධනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ සම්පාදනය

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 18 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "24. ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිසම" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

25. ණය තොරතුරු කාර්යාංශය
26. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

(ඉ) එහි II වැනි තීරුවෙහි 34 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අයිතම 27 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)" ට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය පනත (1990 අංක 18)

(5) එම නිවේදනයෙහි "අංක (9) සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (8) සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. සමාජ සවිබලගැන්වීම් විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 6 සිට 13 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි 1 සිට 4 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- නිවර්තන නිවාස ආඥාපනත (1907 අංක 5)
- දරිද්‍රතා නීති ආඥා පනත (1939 අංක 30)
- වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)
- අයාල ආඥාපනත (1841 අංක 4)
- දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනත (1992 අංක 9)

(6) එම නිවේදනයෙහි "අංක (10) කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි;

(අ) එම ශීර්ෂය "අංක (9) කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 13 වැනි සහ 14 වැනි අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 12 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "8. සීමාසහිත ශ්‍රී ලංකා රැකියා පියස" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

9. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ගාස්තු අය කිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37)" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)
- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)

(7) එම නිවේදනයෙහි "අංක (11) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (10) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍ය " වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන සහ 11 වන අයිතමයන් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන විෂයයට හා II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

11. මහනුවර නගරය තුළ ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරලීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 11 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

12. සීනි කර්මාන්තයට අදාළ රාජ්‍ය සම්පත් කළමනාකරණය හා සුරැකීම

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 13 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 6 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අයිතම 5 සිට 8 දක්වා නැවත අංක ගත කිරීමෙන් ;

(උ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 9 වැනි අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

8. ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

(ඌ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 8 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

9. ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

(එ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "20. ශ්‍රී ලංකා කජු සංස්ථාව" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

21. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
22. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
23. කන්තලේ සීනි සමාගම
24. උක් පර්යේෂණ ආයතනය

(ඒ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත (1975 අංක 13)" ට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)

(8) එම නිවේදනයෙහි අංක "(12) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(11) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය

(9) එම නිවේදනයෙහි අංක (13) ආපදා කළමනාකරණ අමාත්‍ය ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(10) එම නිවේදනයෙහි "අංක (14) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(අ) එම ශීර්ෂය " (12) විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය" වශයෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය යන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 9 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

10. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම

11. රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම

12. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම

13. වෘත්තිය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම

14. කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 15 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "13. කාර්මික තාක්ෂණ ආයතනය" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

14. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
15. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
16. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය
17. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
18. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
19. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන
20. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
21. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
22. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)
23. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය
24. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ශ්‍රී ලංකාවේ "මූලික අධ්‍යයන ආයතන පනත (1981 අංක 55)" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59)
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)
- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)

(11) එම නිවේදනයෙහි අංක (15) හා (16) ශීර්ෂයන් නැවත අංක ගත කිරීමෙන් ;

(12) එම නිවේදනයෙහි අංක (17) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(13) එම නිවේදනයෙහි "අංක (18) ස්වදේශ කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(15) ස්වදේශ කටයුතු අමාත්‍ය

(14) එම නිවේදනයෙහි "අංක (19) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (16) අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍ය" වශයෙන්

එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ආ) එහි I වැනි තීරුවෙහි 7 සිට 11 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 6 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 3 වැනි සහ 4 වැනි අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "2. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

3. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "සංස්කෘතික දේපළ පනත (1988 අංක 73)" අයිතමය ඉවත් කිරීමෙන් ;

(15) එම නිවේදනයෙහි "අංක (20) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (17 ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය" වශයෙන්

(ආ) එහි I වැනි තීරුවෙහි 10 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 11 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 32 වැනි සහ 33 වැනි අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි අයිතම 34 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(16) එම නිවේදනයෙහි අංක "(21) මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය පහත සඳහන් පරිදි :-

(18) මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

(17) එම නිවේදනයෙහි "අංක (22) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (19) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 12 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

13. ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
14. ප්‍රාදේශීය සහ ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සංවර්ධනය
15. ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු
16. ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය
17. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම
18. සත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු
19. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
20. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
21. පශු ක්ෂේත්‍රයේ සත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 22 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "6. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

7. ග්‍රාමීය පුණර්ජීවන අරමුදල
8. ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල (මූල්‍ය)
9. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල)
10. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
11. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
12. සීමාසහිත කිරියා/මිල්ක් ඉන්ඩස්ට්‍රීස් ලංකා (පෞද්ගලික) සමාගම
13. මිල්ක් ඉන්ඩස්ට්‍රීස් ලංකා සමාගම
14. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිසස් සමාගම
15. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතයාතනය පනත (1981 අංක 54)" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)
- සත්ව රෝග පනත (1992 අංක 59)
- සත්ව ආහාර පනත (1986 අංක 15)
- සත්ව පනත (1958 අංක 29)
- පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)

(18) එම නිවේදනයෙහි "අංක (23) වැවිලි කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (20) වැවිලි කර්මාන්ත අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 13 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි අයිතම 12 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඈ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)

(19) එම නිවේදනයෙහි අංක " (24) විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(22) විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය

(20) එම නිවේදනයෙහි "අංක (25) කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (22) කෘෂිකර්ම අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "13. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

14. වී අලෙවි මණ්ඩලය
15. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම)

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)
- කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1978 අංක 11)

(21) එම නිවේදනයෙහි "අංක (26) තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිමයන් ඉවත් කිරිමෙන් ;

(22) එම නිවේදනයෙහි "අංක (27) අධිකරණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (23) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය" වශයෙන්

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන්

1. යුක්තිය පසිඳලීම පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ විෂයයන් සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 12 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

13. බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැළසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
14. බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය
15. ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 16 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "13. ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය" අයිතමය

''13. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් ආර්බිට්රේෂන් සෙන්ටර් (ගරන්ටි) ලිමිටඩ්" වශයෙන්

(ඊ) එහි II වැනි තීරුවෙහි 13 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

14. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
15. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
16. තරුණ විශෝධන පුහුණු පාසැල

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන"ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත (2000 අංක 44)" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- බන්ධනාගාර ආඥා පනත (1877 අංක 16)
- තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28)

(23) එම නිවේදනයෙහි "අංක (28) ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වැනි, II වැනි සහ III වැනි තීරු යටතේ වන අයිමයන් ඉවත් කිරීමෙන් ;

(24) එම නිවේදනයෙහි "අංක (29) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (24) මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. මහාමාර්ග හා මාර්ග සංවර්ධන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 2 සිට 6 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 7 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 1 සිට 5 දක්වා අයිතමයන් සහ 8 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අයිතමයන් නැවත අංක ගත කිරීමෙන් ;

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත දැක්වෙන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)
- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)

(25) එම නිවේදනයෙහි "අංක (30) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (25) රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 11 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

12. නීතිය හා සාමය පවත්වාගෙන යාම
13. සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම
14. ජාතික පොලිස් කොමිෂන් සභාවේ උපදෙස් අනුව පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
15. සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩ පැවැත්වීමට කටයුතු කිරීම
16. රථවාහන ගමනාගමනය පාලනය කිරීම
17. අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 18 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 6 සිට 8 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන " 5. එළදායිතා ලේකම් කාර්යාලය" අයිතමය

" 5. ජාතික එළදායීතා ලේකම් කාර්යාලය වශයෙන්"

(උ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 5 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

6. පොලිස් දෙපාර්තමේන්තුව
7. ජාතික අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලය

(ඌ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47)
- රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)

(එ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "තෑගි පිරිනැමීමේ තරඟ පනත (1957 අංක 37)" ට පසුව පහත අයිතම එකතු කිරීමෙන්

- පොලිස් ආඥා පනත (1865 අංක 16)
- මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)
- ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)
- ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)
- තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28)

(26) එම නිවේදනයෙහි අංක "(31) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ" ශීර්ෂය පහත පරිදි :-

(26) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය

(27) එම නිවේදනයෙහි "අංක (32) නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක ( 27) නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "12. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

13. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33)"ට පසුව පහත අයිතම එකතු කිරීමෙන් ;

- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත (1997 අංක 7)

(28) එම නිවේදනයෙහි අංක (33) සිට අංක (35) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක ගත කිරීමෙන් ;

(29) එම නිවේදනයෙහි "අංක (36) අධ්‍යාපන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (31) අධ්‍යාපන අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 17 සිට 20 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 21 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 12 සිට 20 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි "11. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

10. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත දැක්වෙන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- ටවර් හෝල් රඟහල පදනම පනත (1978 අංක 1)
- ලංකා කලා මණ්ඩල පනත (1952 අංක 18)
- සීගිරි උරුමය පදනම පනත (1998 අංක 62)
- පුරාවස්තු ආඥාපනත (1940 අංක 9)
- ජාතික ලේඛනාරක්ෂක පනත (1973 අංක 48)
- මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත (1999 අංක 44)" ට පසුව පහත අයිතම එකතු කිරීමෙන් ;

- රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)

(30) එම නිවේදනයෙහි "අංක (37) තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(32) තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය

(31) එම නිවේදනයෙහි "අංක (38) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (33) නැවත පදිංචි කිරීම පුනරුත්ථාපන, හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1 නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු පිළිබඳ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 2 සිට 4 දක්වා අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 5 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 1 හා 2 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අයිතමයන් 3 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත දැක්වෙන අයිතමය ඉවත් කිරීමෙන් ;

- බන්ධනාගර ආඥා පනත (1877 අංක 16)

(32) එම නිවේදනයෙහි අංක "(39) ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(34) ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය

(33) එම නිවේදනයෙහි "අංක (40) ක්‍රීඩා අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරිමෙන් ;

(34) එම නිවේදනයෙහි "අංක (41) ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (35) තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන පිළිබඳ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි II වැනි තීරුවෙහි 10 වැනි සහ 12 වැනි අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) 24 එහි II වැනි තීරුවෙහි අයිතම 9 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත දැක්වෙන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)
- සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)
- ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත (2002 අංක 35)

(35) එම නිවේදනයෙහි අංක " (42) විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා" ශීර්ෂය පහත පරිදි :-

(36) විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍ය

(36) එම නිවේදනයෙහි "අංක (43) ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය" ශීර්ෂය පහත පරිදි :-

(අ) එම ශීර්ෂය" (37) ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 2 වැනි අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් එකතු කිරීමෙන් ;

3. රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කරලීම
4. ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම
5. ජාතික ඒකාබද්ධතාව කෙරෙහි බලපාන සම්බාධක හඳුනා ගැනීම හා අදාළ පාර්ශ්ව සමග පැවැත්වෙන සාකච්ඡා හා කතිකා පාදක කොට ගෙන ප්‍රතිපත්තිමය වශයෙන් පියවර ගැනීම
6. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සහයෝගීත්වයෙන් ක්‍රියා කරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගැටලු ඇතොත් ඒවා සමනය කිරීම
7. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය පිළිබඳව දැනට ක්‍රියාත්මක කෙරෙන සහ යථා කාලයේ දී ක්‍රියාත්මක කිරීමට උචිත විවිධ උපාය මාර්ග සමාලෝචනය සහ ගැටලු නිරාකරණයට මැදිහත් වීම
8. ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාකරනු ලබන අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම
9. ඉහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය වේ නම් අරමුදල් යථායෝග්‍ය ක්‍රමවේද අනුව සෙවීම

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 10 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(37) එම නිවේදනයෙහි "අංක (44) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (38) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 6 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

7. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ දුබලතාවන් හඳුනාගැනීම හා පුනරුත්ථාපනය සිදුකිරීම
8. මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම
9. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම
10. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම
11. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම
12. ආබාධිතයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම
13. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 14 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 3 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන " 2. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

3. සමාජ සේවා දෙපාර්තමේන්තුව
4. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
5. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
6. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව

(උ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46 )" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- නිවර්තන නිවාස ආඥාපනත (1907 අංක 5)
- දරිද්‍රතා නීති ආඥා පනත (1939 අංක 30)
- වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)
- අයාල ආඥාපනත (1841 අංක 4)
- දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනත (1992 අංක 9)

(38) එම නිවේදනයෙහි "අංක (45) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එම ශීර්ෂය "අංක (39) වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 11 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

12. ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත් ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම, ප්‍රතිසාධනය හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය
13. ජාතික ප්‍රතිපත්ති මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකසීම
14. ව්‍යසන ලිහිල් කරලීම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය
15. ඉහත කාර්යභාරයන් නිසි වේලාවට ක්‍රියාත්මකවීම සහතික කර ගැනීම පිණිස අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන හා නියෝජිතායතන, පුද්ගලික ආයතන, දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය
16. පාරිසරික අවදානම් වලට ඔරොත්තු දිය හැකි තාක්ෂණික ප්‍රමිතියකින් යුත් නිවාස තැනීම ප්‍රවර්ධනය කිරීම
17. නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම
18. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම
19. ස්වභාවික ව්‍යසන පෙරයීම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම
20. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
21. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
22. ජාත්‍යන්තර මානුෂීය සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 23 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන " 3. ගංගාධාර උණ වගා ව්‍යාපෘතිය" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

4. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව
5. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
6. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
7. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
8. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ජල සම්පත් මණ්ඩල පනත (1964 අංක 29)" ට පසුව පහත අයිතම එකතු කිරීමෙන් ;

- ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)

(39) එම නිවේදනයෙහි "අංක (46) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි ː-

(අ) එම ශීර්ෂය "අංක (40) පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය" වශයෙන්

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන්

1. පළාත් සභා හා පළාත් පාලන සහ ක්‍රීඩා විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයන්හි අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඇ) එහි I වැනි තීරුවෙහි 7 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

8. ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ක්‍රීඩා ක්ෂේත්‍ර තුළ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වර්ධනය කිරීම
9. ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
10. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදාගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
11. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදුකිරීම

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 12 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන "2. දේශීය ණය සහ සංවර්ධන අරමුදල" අයිතමයට පසුව පහත අයිතම එකතු කිරීමෙන් ;

3 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
5. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
6. ජාතික ක්‍රීඩා සභාව
7. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
8. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත (1988 අංක 37)" ට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- ක්‍රීඩා නීතිය (1973 අංක 25)
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරී පනත (1999 අංක 17)
- ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය) ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)

(40) එම නිවේදනයෙහි අංක " (47) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ" ශීර්ෂය පහත සඳහන් පරිදි ː-

(41) සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය

(අ) එහි I තීරුවෙහි අයිතම 11 ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි අයිතම 4 ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි III වැනි තීරුවෙහි "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)" ඉවත් කිරීමෙන් ;

(41) එම නිවේදනයෙහි අංක (48) විශේෂ කාර්යභාර ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(42) එම නිවේදනයෙහි "අංක (49) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි ː-

(අ) එම ශීර්ෂය "අංක (42) තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 වන අයිතමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ;

1. තිරසර සංවර්ධනය, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධනය විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

(ඈ) එහි I වැනි තීරුවෙහි 3 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

4. පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා නීති සහ උපායමාර්ග සම්පාදනය කිරීම
5. තිරසර මිනුම් සහ පාරිසරික පිය සටහන් දර්ශකය සම්පාදනය කිරීම
6. තිරසර සංවර්ධනය සඳහා වන ලේකම් කාර්යාලය පිහිටුවීම
7. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම
8. සිව්පාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශි කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු
9. වනජීවී සම්පත් සංරක්ෂණය
10. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 11 සිට නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවට පහත අයිතමයන් ඇතුලත් කිරීමෙන් ;

1. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
2. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. වනජීවී භාරය

(ඊ) එහි III වැනි තීරුවට පහත අයිතමයන් එකතු කිරිමෙන් ;

- ජාතික සත්වෝද්‍යාන පනත (1982 අංක 41)
- උද්භිද උද්‍යාන ආඥාපනත (1928 අංක 31)
- වන සතුන් හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (1937 අංක 2)

(43) එම නිවේදනයෙහි අංක "(50) නිතීය හා සාමය පිළිබඳ අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(44) එම නිවේදනයෙහි අංක "(50) නිතීය හා සාමය පිළිබඳ අමාත්‍ය" ශීර්ෂයේ I වන, II වන සහ III වන තීරුවලට පසුව පහත නව ශිර්ෂය, I වන, II වන සහ III වන තීරු හා අයිතමයන් ඇතුලත් කිරීමෙන්

(43) උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය

*I වැනි තීරුව*

**කාර්යයන් හා කර්තව්‍යයන්**

1. උසස් අධ්‍යාපන හා සංස්කෘතික විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධවීම හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම
3. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

*II වැනි තීරුව*

**දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු විශ්වවිද්‍යාල
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලුම පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන
4. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
5. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
6. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
7. මහපොළ භාරකාර අරමුදල
8. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
9. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
10. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

**ක්‍රියාත්මක කළයුතු පනත්**

- විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)
- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)
- සංස්කෘතික දේපළ පනත (1988 අංක 73)
- ටවර් හෝල් රඟහල පදනම පනත (1978 අංක 1)
- ලංකා කලා මණ්ඩල පනත (1952 අංක 18)

*I වැනි තීරුව*

**කාර්යයන් හා කර්තව්‍යයන්**

4. රැකියා වෙළෙඳපොළ ඉල්ලුමට ගැළපෙන උපාධිධාරීන් බිහිකිරීමට විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධනයන් සිදුකිරීම හා ඊට අවශ්‍ය මානව සම්පත් සැපයීමට සුදුසු පියවර ගැනීම
5. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මගින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා සඳහා අන්තර්ජාතික පිළිගැනීම ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
6. බෞද්ධ හා පාලි අධ්‍යනය ඉහළ නැංවීම සහ භික්ෂූන්වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
7. තරුණ ප්‍රජාව වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම
8. ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
9. විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම
10. සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන්ට හානි නොවන පරිදි සංස්කෘතිය පදනම් වූ සංචාරක වැඩසටහන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම
11. සිංහල විශ්ව කෝෂය, සිංහල ශබ්ද කෝෂය හා මහා වංශය සම්පාදනය සඳහා අඛණ්ඩව අවශ්‍ය පියවර ගැනීම
12. ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදාගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
13. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
14. නවීන හා සම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
15. නාට්‍ය සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම

*II වැනි තීරුව*

**දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා**

11. ටවර්හෝල් රඟහල පදනම
12. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
13. ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය
14. ජාතික කලා මණ්ඩලය
15. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
16. අපේ ගම
17. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
18. මධ්‍යම සංස්කෘතික අරමුදල
19. ජාතික චිත්‍රපටි සංස්ථාව

*III වැනි තීරුව*

**ක්‍රියාත්මක කළයුතු පනත්**

- සීගිරි උරුමය පදනම පනත (1998 අංක 62)
- පුරාවස්තු ආඥාපනත (1940 අංක 9)
- ජාතික ලේඛනාරක්ෂක පනත (1973 අංක 48)
- මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)
- රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| **කාර්යයන් හා කර්තව්‍යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළයුතු පනත්** |
| 16. රාජ්‍ය ලේඛණ විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම | | |
| 17. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයට පැවරී ඇති අනිකුත් සියලුම විෂයයන් | | |
| 18. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනය අධීක්ෂණය කිරීම | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.